නිති අසන පැන

මම සංචාරක, ව්‍යාපාරික හෝ ශිෂ්‍ය වීසාවක් සඳහා සුදුසුකම් ලබන්නේ කෙසේද?

සංචාරක හෝ ශිෂ්‍ය වීසාවක් සඳහා සුදුසුකම් ලැබීමට, එක්සත් ජනපදයේ තාවකාලිකව රැඳී සිටීමෙන් පසු අයදුම්කරුවන්ට ආපසු යෑමට බල කෙරෙන, එක්සත් ජනපදයෙන් පිටස්තර රටක ස්ථිර පදිංචියක් හෝ වෙනත් බැඳීම් තිබිය යුතුය. නීතියට අනුව මෙය ඔප්පු කිරීමේ වගකීම ඇත්තේ අයදුම්කරුටයි.

"බැඳීම්" යනු අයදුම්කරු ඔහුගේ හෝ ඇයගේ නේවාසික රටට බැඳ තබන ජීවිතයේ විවිධ අංශයි. මෙයට හොඳම උදාහරණ වන්නේ උරුමයන්, රැකියාව, සමාජ හා පවුල් සබඳතා ආදියයි. එක්සත් ජනපදයේ සංචාරය අවසානයේ අයදුම්කරුට තම රටට යෑමට තුඩුදෙන හේතු ඇති බව කොන්සියුලර් නිළධාරියාට ඒත්තු ගැන්වීම සඳහා පවුල්, සමාජීය හා ආර්ථික බැඳීම්වල එකමුතුවක් අවශ්‍ය වේ. ශිෂ්‍ය වීසා අයදුම්කරුවන්, එක්සත් ජනපදයේ පූර්ණ කාලීන පාඨමාලාවක් සඳහා තමන් සුදුසුකම් ලබා ඇති බව ඔප්පු කළ යුතු අතර, ඔවුන් එක්සත් ජනපදයට ඇතුල් වන්නේ පිළිගත් අධ්‍යාපන ආයතනයක පූර්ණ කාලීන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට පමණක් බවද පෙන්වා දිය යුතුවේ.

වීසා අයදුම්පත් ප්‍රතික්ෂේප වන්නේ ඇයි.?

සංක්‍රමණික නොවන සියළුම වීසා අයදුම්කරුවන්, එසේ නොවන බව ඔප්පු කරන තුරු, සංක්‍රමණය වීමට අපේක්ෂිත අයෙක් ලෙස සැලකීමට, එක්සත් ජනපද ආගමන නීතිය අනුව කොන්සියුලර් නිළධාරීන්ට සිදුවේ. සුදුසුකම් ලැබීම සඳහා අයදුම්කරුවන් එක්සත් ජනපදය හැර වෙනත් රටකට දැඩි බැඳීම් ඇති බව පෙන්වා දිය යුතු අතර, කෙටි කාලයක් රැඳී සිටීමෙන් පසුව එක්සත් ජනපදය හැර යාමට එම බැඳීම් ප්‍රබල බවද පෙන්වා දිය යුතුය.

අපරාධවලට වරදකරු වීම, හෝ වීසා අයදුම්පතක වංචා සහගත හෝ සාවද්‍ය තොරතුරු දැක්වීම වැනි පොදු චෝදනා වැනි, නීතිය සම්බන්ධ අනික් කරුණු නිසාද සමහර අයදුම්පත් ප්‍රතික්ෂේප වේ.

මට ඇමෙරිකානු අනුග්‍රාහකයෙක් සිටීම අවශ්‍යද?

නැත. වීසා අයදුම්කරුට ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත් තරම් ප්‍රබල ආර්ථික, සමාජයීය හා පවුල් සබඳතා ඇතිබව පෙන්වා දීමේදී නෑයන්, මිත්‍රයින් හෝ ඇමෙරිකානු ජාතිකයන්ට හෝ සහාය විය හැක්කේ ඉතා සුළු වශයෙනි. එක්සත් ජනපදයේ සිටින නෑයන් හා මිතුරන්ගේ රෙකමදාරු, අනුග්‍රාහක ලිපි හා අනිකුත් ආකාරයේ සහතිකවීම් ආදිය කොන්සියුලර් නිළධාරියාට, අයදුම්කරු සංචාරය කරන හේතුව හා ඇමරිකාවේ සිටින විට ඔහුට ලැබෙන සහාය ආදිය ගැන අවබෝධයක් ලබාගැනීමට උපකාරී විය හැක. එක්සත් ජනපදයට යෑමට හොඳ හේතුවක් තිබීම හෝ එහිදී නැවති සිටීමට තැනක් තිබීම අයදුම්කරුගේ මව්රටට ඇති සම්බන්ධකම් තහවුරු නොකරයි. සෑම අයදුම්කරුවෙක්ම තමන්ගේ තත්වයන් මත පදනම්ව සුදුසුකම් ලැබිය යුතුය. අයදුම්කරු ඔහුගේ හෝ ඇයගේ රටට ආපසු යන බව ඇමෙරිකානු අනුග්‍රාහකයන්ට සහතික කළ හැකි විධිවිධාන නීතියේ දක්වා නැත.

නිළධාරියා මගේ ලියවිලි නොබැලුවේ ඇයි?

සංක්‍රමණික නොවන වීසා සඳහා අයදුම්කිරීම මූලික වශයෙන් සම්මුඛ පරීක්ෂණය මත පදනම් වූ ක්‍රියාවලියකි. තමන්ගේ රටේ අයදුම්කරුට හොඳ ස්ථාවර තත්වයක් ඇතිබව දක්වන ලියවිලි, සමහර අවස්ථාවන්හිදී එක්සත් ජනපදයේ කෙටි සංචාරයකින් පසුව තම රටට ආපසු යන බව පෙන්වීමට උදව් විය හැකිය. කාරණයේ තත්වය අනුව, යෝග්‍යතාව නිර්ණය කිරීමට නිළධාරියෙකු ලේඛන පරීක්ෂා කිරීමට හෝ නොකිරීමට ඉඩ තිබේ.

තීරණය වෙනස් කිරීමට උදව් කළ හැක්කේ කාටද?

වීසාවක් ප්‍රතික්ෂේප වූ අයදුම්කරුවන් සඳහා වූ අභියාචනා ක්‍රියාවලියක් නැත. කොන්සියුලර් නිළධාරියාගේ තීරණය අවලංගු කිරීමට කිසිවෙකුට නීත්‍යානුකූල බලයක් නැත.

සියළුම අයදුම්කරුවන්ට නැවත අයදුම් කළ හැකිය. නමුත් අයදුම්කරුගේ තත්වය වෙනස් වී ඇත්නම් හෝ ඉදිරිපත් කිරීමට අළුත් තොරතුරු ඇත්නම් හෝ මිසක නැවත අයදුම්කිරීම අපි නිර්දේශ නොකරමු.

අනුග්‍රාහකයෙක්, ඇමෙරිකානු ජාතිකයෙක්, නීතිඥයෙක් හෝ නෑදෑයෙක් පැමිණීමෙන් හා /හෝ දුරකථන ඇමතුම් ලබා දීමෙන් වීසා සම්මුඛ පරීක්ෂණ තීරණ වෙනස් කළ නොහැක. එක්සත් ජනපදයේ රහස්‍යභාවය පිළිබඳ රෙගුලාසිවලට අනුව, අයදුම්කරු හැර වෙනත් කිසිවෙකු සමඟ ඒ පිළිබඳ විස්තර සාකච්ඡා කිරීම නහනම් වෙයි. කෙසේවෙතත් කොන්සියුලර් නිළධාරීන්ට එක්සත් ජනපද ආගමන නීතිය ගැන තොරතුරු සැපයීමට පුළුවන. මෙම තොරතුරු ලබාගැනීමට පහසුම ක්‍රමය වන්නේ අපේ වෙබ් අඩවිය සමාලෝචනය කිරීම (http://www.travel.state.gov) හෝ අපේ විද්‍යුත් තැපැල් ලිපිනයට (consularcolombo@state.gov) ලිවීමයි.

අවාසනාවකට මෙන් සමහර අයදුම්කරුවන් කී වරක් අයදුම් කළත්, ඔවුන්ගේ පුද්ගලික, ව්‍යාන්තීය හෝ මූල්‍ය තත්වය සැළකියයුතු අන්දමකට වෙනස් වන තුරු සංක්‍රමණික නොවන වීසාවකට සුදුසුකම් නොලබති.

වීසාවක් නිකුත් කළත්, නැතත් වීසා සඳහා අයදුම් කරන සෑම වාරයකම ආපසු නොගෙවන අයදුම්පත්‍ර ගාස්තුව ගෙවිය යුතු බව නැවත ඉල්ලුම් කරන අයදුම්කරුවන් සිහිතබාගත යුතුය.